www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව තුල එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මිලිටරි මැදිහත්වීමක් පිලිබඳ ඉහල පෙලේ සාකච්ඡා දිගටම

## Top-level talks continue on US-led military intervention in Sri Lanka

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2009 මාර්තු 10**

දිවයිනේ සිවිල් යුද්ධයට කොටුවී සිටින සිවිල් වැසියන් ඉවත්කරගැනීමේ කඩතුරාව යටතේ උතුරු ශ්‍රී ලංකාවේ ඇමරිකානු නායකත්වයෙන් යුක්ත මිලිටරි මැදිහත්වීමක් පිලිබඳව වොෂිංටනය, කොලඹ හා නව දිල්ලිය සම්බන්ධ වන ඉහල පෙලේ සාකච්ඡා සිදු වන බවට තව දුර සාක්ෂ්‍ය ඉස්මත්තට පැමින තිබේ.

පසුගිය සති අන්තයේ දී දකුනු ආසියානු මාධ්‍යවේදීන් කන්ඩායමක් අමතමින් සිටිය දී, දකුනු හා මධ්‍යම ආසියානු කටයුතු පිලිබඳ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර්ගෙන්, පැසිෆික් අන දෙන මන්ඩලයට (පැකොම්) අනුබද්ධිත මෙරයින් කාර්යසාධන බලකායක් ශ්‍රී ලංකාවට එවීමේ සැලසුම් එලිදරව් කරමින් කොලඹ පලව ඇති ප්‍රවෘත්ති වාර්තා ගැන විමසන ලදි.

විස්තර පැහැදිලිව සඳහන් කිරීම හිතාමතාම මගහැරි බව්චර් සාකච්ඡා සිදු වන බව තහවුරු කලේය. "හැකියාවන් මොනවාද යන වග හඳුනාගනු වස් තත්වය සොයාබැලීමේ යෙදී සිටින අය අපට එහි සිටිනවා. මේ මිනිස්සුනට උදව් කරන්න අපට පුලුවන් ඕනෑම දෙයක් අපට කල හැකියි." යයි ඔහු පැවසීය.

කල්කටාවේ පාදක ටෙලිග්‍රාෆ් පත්‍රයේ වොෂිංටන් වාර්තාකරු වන කේ.පී. නයාර් එකම සවිස්තර වාර්තා සපයා ඇත. එක්සත් ජනපද මාධ්‍ය තුල කිසිදු වාර්තාවක් පල වී නැති වුවත්, නයාර් සඳහන් කරන පරිදි: "ආක්‍රමනය සිදු වුව හොත්, එය ඔබාමා පාලනාධිකාරය ඇමරිකාවේ බලය අලුවෙත් ප්‍රදර්ශනය කරමින් එතෙර දී සිය මස්පිඩු නටවන ප්‍රථම අවස්ථාව වනු ඇත."

ටෙලිග්‍රාෆ් වාර්තාවට අනුව, පැකොම් කන්ඩායමක් යෝජනාව ගැන ශ්‍රී ලංකාවේ හමුදාව සමග සාකච්ඡා කරනු වස් සති දෙකකට ඉහත දී කොලඹ සංචාරයක යෙදුනේය. කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ උප මෙහෙයුම් ප්‍රධානි ජේම්ස් මුවර්, ස්වාධීන තක්සේරුවක් ලබාගනු පිනිස උතුරේ යාපන අර්ධද්වීපයට යවන ලදි. "මුවර්ගේ වාර්තාව, එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත දෙමල ජනයා ඉවත්කරගැනීමක් පිලිබඳ අදහස පිටුපස පෙලගැසීම පිනිස හිලරි ක්ලින්ටන්ගේ රාජ්‍ය දෙපාර්තමේන්තුව පොලඹා ඇතැයි කියනු ලැබේ." යයි ලිපිය සඳහන් කලේය.

200,000ක් පමන වන ජනතාවක් ප්‍රමානවත් ආහාර, හිසට සෙවනක් හා වෛද්‍ය සේවා නොමැතිව හැකිලෙමින් පවතින එල්ටීටීඊ-පාලිත කුඩා භූමි ප්‍රදේශයක් තුල කොටුවී ඉවබවක් නැතිව එල්ල වන වෙඩි හා බෝම්බ ප්‍රහාරවලට ගොදුරු වන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ජාත්‍යන්තර සහන ඒජන්සි තක්සේරු කරයි.

ශ්‍රී ලංකා ආන්ඩුව සහ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය යන දෙපාර්ශ්වයම කොටුවූ දෙමල සිවිල් ජනයා දේශපාලන ඉත්තන් ලෙස යොදා ගනිති. හමුදාව, මුලු බලය යොදා ගෙනයන අවසන් ප්‍රහාරයක් සඳහා මාවත එලිපෙහෙලි කරගනු වස්, සිවිල් ජනයා පලවා හැර ඔවුන් දැවැන්ත රැඳවුම් කඳවුරුවලට ගාල් කිරීමට උත්සාහ කරයි. සටන්විරාමයක් හා සාකච්ඡා නොමැතිව සිවිල් ජනයාට ඉවත්වීමට ඉඩදීම එල්ටීටීඊය ප්‍රතික්ෂේප කරයි. සටන්විරාමයක් හා සාකච්ඡා පිලිබඳ යෝජනාව ආන්ඩුව මුලුමනින්ම ප්‍රතික්ෂේප කර තිබේ.

එක්සත් ජනපද මෙරයින් භටයන් උතුරු ශ්‍රී ලංකාවට යැවුව හොත්, එල්ටීටීඊ සටන්කරුවන් සමග ගැටුම් පැනනැගීමට ඉඩ ඇත. කාර්යසාධන බලකායට එක්සත් ජනපද නාවික හා ගුවන් හමුදා සහයෝගය ලැබීමට ඉඩ තිබේ. ප්‍රන්සය ද මිලිටරි මෙහෙයුමට සම්බන්ධවීමේ සිය කැමැත්ත පෙන්නුම් කර ඇති බව වාර්තා වේ.

එක්සත් ජනපද මැදිහත්වීම ජනයා ඉවත්කරගැනීමේ සැලසුමක් ලෙස වෙස්ගන්වා ඇති නමුත්, එය මෙහෙයවෙන්නේ, දෙමල සිවිල් ජනයා පිලිබඳ උත්සුකතා මගින් නොවේ. ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ 2002 සටන්විරාමය බිඳ දමා 2006 ජූලි මස ප්‍රථම ආක්‍රමනික මෙහෙයුම දියත් කල අවස්ථාවේ පටන් මේ දක්වා, වොෂිංටනය කොලඹ ආන්ඩුවේ සාපරාධී යුද්ධයට රාජ්‍යතාන්ත්‍රික හා මිලිටරි සහයෝගය සම්පාදනය කර ඇත. පසුගිය වසර දෙකහමාරක කාලය තුල සටන් මගින් දහස් සංඛ්‍යාත සිවිල් ජනයා ඝාතනය කෙරී ඇති අතර, දරුනුම මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳව එක්සත් ජනපදය හා එහි සගයන් වෙතින් විටින්විට කෙරෙන කෙඳිරිලි සහගත විරෝධතාවකට වැඩි යමක් මතුව නැත.

ශ්‍රී ලංකාව තුල ඔබාමා පාලනාධිකාරයේ අවශ්‍යතා මෙහෙයවනු ලබන්නේ, එල්ටීටීඊ මිලිටරි බිඳවැටීමක දේශපාලන ඇඟවුම් පිලිබඳව පවතින උත්සුකතා මගිනි. එල්ටීටීඊයට එරෙහි හමුදාවේ ඉදිරිගමන, 25 වසරක යුද්ධය නිර්මානය කල දෙමල විරෝධී වෙනස්කම්කිරීමේ දශක ගනනාවක නිල පිලිවෙත විසඳනවා නොව, ශ්‍රී ලංකාව හා අසල්වැසි ඉන්දියාව තුල වාර්ගික ආතතීන් උත්සන්න කර ඇත. ශ්‍රී ලංකා හමුදාවේ ලේවැගිරීමක් පිලිබඳ වාර්තා විභවීය වසයෙන් පුපුරනසුලු ප්‍රතිවිපාක නිර්මානය කරනු ඇත.

පසුගිය සිකුරාදා කොලඹ දී කල අදහස් දැක්වීමක දී, එක්සත් ජනපද තානාපති රොබර්ට් බ්ලේක් "ගැටුමට, සියලුම ජන කන්ඩායම්වල අභිලාෂයන් සුරක්ෂිත කෙරෙන, ප්‍රවර්ධනය කෙරෙන හා රැකගන්නා, දේශපාලන විසඳුමක්" සඳහා වන වොෂිංටනයේ ඉල්ලීම යලිත් අවධාරනය කලේය. කෙසේවෙතත්, සිංහල අධිපතිවාදය මත පදනම් වූ රාජ්‍යයක් නිර්මානය කර ඇති තතු යටතේ, ශ්‍රී ලංකාවේ අනුප්‍රාප්තික ආන්ඩු, දෙමල සුලුතරයට මොන යම් හෝ සීමිත සහනයක් පවා දීමට මුලුමනින්ම අපොහොසත් බව ඔප්පු කර තිබේ.

දිවයින මත එක්සත් ජනපද මිලිටරි පැවැත්මක් තහවුරු කරගැනීම, එල්ටීටීඊය නිත්‍ය මිලිටරි හමුදාවක් ලෙස විනාශ කෙරෙන තත්වයක දී වොෂිංටනයට සිය අවශ්‍යතාවන්ගේ ආරක්ෂාව සහතික කරගැනීමට වඩා විශාල බලයක් නිසැකවම සම්පාදනය කරනු ඇත. කෙටිකාලීනව ගත් කල, දැනටමත් දේශපාලන වෙඩිබෙහෙත් පෙට්ටියක් බවට පත්ව ඇති කලාපයක් තව දුරටත් අස්ථාවරවීම වලකාගැනීමට එක්සත් ජනපදය උත්සාහ කරයි. දිගුකාලීනව ගත් කල, දකුනු ආසියාවට හා මැද පෙරදිගට යාබදව ද ඊසානදිග ආසියාවට වැටී ඇති ප්‍රධාන නාවික මාවත් හරහා ද මූලෝපායිකව පිහිටි ශ්‍රී ලංකාව තුල සිය පදනම ශක්තිමත් කරගැනීමට ද වොෂිංටනය උත්සාහ කරයි.

ශ්‍රී ලංකාව තුල එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මැදිහත්වීමක් ප්‍රධාන අංගයක් වන්නේ, දිවයින සිය කලාපීය ආනුභාව ක්ෂේත්‍රයේ කොටසක් ලෙස සලකන ඉන්දියාවේ ආකල්පයයි. නව දිල්ලිය පසුගිය තුන් වසර තිස්සේ අසීරු සමබර ක්‍රියාවලියක නිරත වී තිබේ. ඉන්දියානු ආන්ඩුව, බොහෝ සෙයින්, ශ්‍රී ලංකා හමුදාවට සැපයුම් ලබා දී ඇති ප්‍රතිවාදී පකිස්තානයේ හා චීනයේ වැඩෙන ආනුභාවය සීමා කිරීම පිනිස, රාජපක්ෂගේ යුද්ධයට දේශපාලනිකව හා මිලිටරිමය ලෙස සහයෝගය දී ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ යුද්ධය දකුනු ඉන්දියාවේ දෙමල ජනයා අතර වෛරය අවුලුවා ඇති නිසා, වැනෙමින් ගමන් කිරීමට එයට බල කෙරී තිබේ.

පසුගිය දශකය තිස්සේ, වොෂිංටනය හා නව දිල්ලිය, විශේෂයෙන් ම චීනයේ වැඩෙන ආනුභාවය පිලිබඳ පොදු උත්සුකතාවක් මත පදනම් වූ, සමීප මූලෝපායික හවුලක් වර්ධනය කරගෙන ඇත. කෙසේවෙතත්, එම රටවල් දෙකේ අවශ්‍යතා මුලුමනින්ම සම්පාත නොවේ. උතුරු ශ්‍රී ලංකාවේ ඒකපාර්ශ්වීය එක්සත් ජනපද මැදිහත්වීමක්, එක්සත් ජනපදය ඉන්දියානු ආනුභාවයට වලකපන බවට නව දිල්ලියේ දේශපාලන සංස්ථාපිතය තුල භීතිය මතුකරනු ඇත.

ඉන්දියාව යුද සරනගතයන් ඉවත්කරගැනීමේ දී සහායදීමට ඇති ස්වකීය සූදානම දැනටමත් පෙන්නුම් කර ඇත. ඉන්දියානු වෛද්‍ය කන්ඩායමක් ඊයේ ශ්‍රී ලංකාව ලගා විය. එමෙන්ම, 1980 ගනන් අග දී උතුරු ශ්‍රී ලංකාවට සිදු කල සිය "සාමසාධක" මෙහෙයුම ව්‍යසනයෙන් කෙලවර වූවාට පසුව, පූර්න පරිමාන මිලිටරි මැදිහත්වීමකට සම්බන්ධ වීමට නව දිල්ලිය පැකිලීමක් දක්වයි.

ටෙලිග්‍රාප් පත්‍රයට අනුව, ඉන්දියානු විදේශ ලේකම් ෂිව් ශන්කර් මෙනන් සමග මේ සතියේ වොෂිංටනයේ දී පැවැත්වෙන සාකච්ඡාවල දී මිලිටරි මැදිහත්වීම පිලිබඳව නව දිල්ලිය දැනුවත් කිරීමට ඔබාමා පාලනාධිකාරය බලාපොරොත්තු වේ. "සිය දකුනු පිලිකන්න තුල වැඩෙන අර්බුදය සමග පොරබඳන්නේ කෙලෙසද යන වග සම්බන්ධයෙන් ඉන්දියානු ආන්ඩුව තුල පවත්නා බරපතල මතභේද" ලෙස එය විස්තර කල තත්වයට ද එම ලිපිය අවධානය යොමු කොට ඇත.

ජාතික ආරක්ෂක උපදේශක එම්.කේ. නාරායනන් මිලිටරි ක්‍රියාමාර්ගයකට මොන යම් හෝ සහයෝගයක් දීමට විරුද්ධ බව වාර්තා වේ. "නාරායනන්ගේ ප්‍රධාන උත්සුකතාව පවතින්නේ, එල්ටීටීඊයේ පැහැදිලි අනුමත කිරීමකින් තොරව සිදු කෙරෙන ජනයා ඉවත්කිරීමක ද එහි ප්‍රතිවිපාක ලෙස සිදු වන දෙමල ජනයාගේ ලේවැගිරීමක ද ප්‍රතිඵලය ලෙස ලෝක් සභා (පහල මන්ත්‍රී මන්ඩලයේ) මැතිවරන මත ඇති කර හැකි බලපෑම පිලිබඳවය." යයි පුවත්පත සඳහන් කලේය.

ඉන්දියානු පාර්ලිමේන්තු මැතිවරන අප්‍රේල් 16 හා මැයි 18 අතර පැවත්වීමට නියමිතය. කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුව, දෙමල පක්ෂ ද ඇතුලු, යන්තම් වාත්තු කරගත් සන්ධානයක් මත රදා පවතී. ශ්‍රී ලංකාවේ යුද්ධය පිලිබඳ විරෝධතාවන්ට මුහුන දී ඇති තතු යටතේ, දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ සිටින ආන්ඩුවේ හවුල්කාර පක්ෂ එක අවස්ථාවක දී, සටන් නතර කිරීමට පියවර නොගන්නේ නම් පාර්ලිමේන්තුවෙන් ඉවත් වන බවට ද තර්ජනය කලහ.

එමෙන්ම, ටෙලිග්‍රාප් පත්‍රය වාර්තා කලේ, විදේශ කටයුතු ඇමති ප්‍රනාබ් මුඛර්ජි, "නිරීක්ෂකයකුගේ තත්වයට එහා

යන මොන යම් හෝ භූමිකාවක් ඉන්දියාවට ලබා නොදී දෙමල සිවිල් වැසියන් ගලවාගැනීමේ එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මෙහෙයුමක් සිදු වුව හොත්, කලාපීය බලවතකු හා නැගෙන ගොලීය බලවතකු ලෙස සිය ගෞරවය විශාල වසයෙන් අහිමිව යාමකට නව දිල්ලිය මුහුන දෙනු ඇත යන්න දන්නා බවයි.

ඉන්දියානු විදේශ ලේකම් මෙනන් සමග වොෂිංටනයේ පැවැත්වෙන සාකච්ඡාවල ප්‍රතිඵලය කුමක් වුවත්, දැනටමත් පැහැදිලි කාරනාව වන්නේ, එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මොන යම් හෝ මැදිහත්වීමක් මෙහෙයවෙනු ඇත්තේ, උතුරු ශ්‍රී ලංකාවේ දෙමල සිවිල් ජනයා මුහුන දෙන මංමුලාසහගත තත්වය මගින් නොව, භූ-දේශපාලනික අවශ්‍යතා මගින් බවයි.

© www.wsws.org